**ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 30,000,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | වැය විෂයය අංක 28-2507(13) ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය - මේ සඳහා අරමුදල් සම්පාදනය කරන ලද ආයතන විසින්ම අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට පසුව කටයුතු කිරීම නිසා රු. 25,000,000 ක් වූ ප්‍රතිපාදන ඉතිරි විය.<br><br>වැය විෂයය අංක 23-2507(13) අන්තර් ජාතික ශ්‍රම සංඛ්‍යාලේඛනඥවරුන්ගේ 19 වන සම්මේලනය ගත් තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියමු අධ්‍යයනය(ICSL) - 2023 වසරේදී ජාතික අවශ්‍යතාවයක් වූ ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය කඩිනමින් සිදු කිරීමට ප්‍රමුඛතාවය දී කටයුතු කිරීමත්, ජන හා නිවාස සංගණනයේ රාජකාරී සඳහා අංශයේ නිලධාරීන් යෙදවීමට සිදුවීමත් නිසා මෙම අධ්‍යයනය සමාලෝචිත වර්ෂය තුල සිදු කිරීමට නොහැකි වීම ප්‍රතිපාදන ඉතිරියට මෙය හේතු වී ඇත. 2024 වර්ෂය තුලදී මෙම කාර්යය අවසන් කිරීමට අපේක්ෂා කරමි. | වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාර්කිකව පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | තවත් මූලධන වැය විෂයයන් 14 ක එකතුව රු. 1,369,796,961 ක් වූ ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 456,633,602 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එක් එක් වැය විෂයය වෙනුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 73 අතර පරාසයක පවතින බව නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූලධන වැය විෂයන් 14 කට සලසා දී තිබූ ශුද්ධ ප්‍රතිපාදනය සහ ඉතිරිවූ ප්‍රතිපාදනය අතර අනුපාතය 5% ත් 73% ත් අතර පරාසයක පැවති අතර ඒ සඳහා හේතු වූ කරුණු 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ACA-2(ii) ආකෘතිය යටතේ දක්වා ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් වන වැටුප් හා වේතන වැය විෂයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 89,599,299 ක් හෙවත් සියයට 13 ක් ඉතිරි කර තිබූ අතර බදු කුලී සහ පලාත් පාලන ආයතන බදු වැය විෂයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 1,016,829 ක් හෙවත් සියයට 51 ක් ඉතිරි වී තිබුණි. | 2023 වර්ෂය සඳහා නව බඳවා ගැනීම් සිදු නොකිරීම සහ වැටුප් රහිත නිවාඩු මත නිලධාරීන් විදේශ ගතවීම වැටුප් හා වේතන වැය විෂයේ ප්‍රතිපාදන ඉතිරි වීම සඳහා හේතු විය.<br><br>බදු කුලී හා පළාත් පාලන ආයතන බදු වැය විෂයය සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේ දී ප්‍රධාන කාර්යාලය සඳහා බදු කුලී ඇතුලත් කල ද ඒ සඳහා අපේක්ෂිත බදු තක්සේරු වාර්තා නොලැබීම මත මෙම ඉතිරිවීම් සිදු විය. | -එම- |
| (ඈ) | වැය විෂයය අංක 25-2507(13) යටතේ පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ ගෘහ සමීක්ෂණය වෙනුවෙන් රු. 12,155,700 ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එයින් රු. 10,985,700 ක් උපයෝජනය කර රු. 1,170,000 ක් හෙවත් සියයට 10 ක් ඉතිරි වී තිබුණි. | වැය විෂයය අංක 25-2507(13) යටතේ මෙම සමීක්ෂණය සඳහා 2023 වර්ෂයට රු.12,155,700 මුදලක් ප්‍රතිපාදන ලෙස වෙන්කරනු ලැබුවද අදාල ගෙවීම් කිරීම සඳහා වූ අනුමැතිය ලැබුනේ 2023.12.04 දිනදීය. ඒ අනුව අදාල වව්චර් පත් පිලියෙල කර එම කාල සීමාව තුලදී වූ ගෙවීම් කලහැකි මුදල වන රු.10,985,000 පමණක් අක්මුදල් ලෙස ගෙන්වා ගැනීමට කටයුතු කරන ලදි. එම සම්පූර්ණ මුදලම එම වර්ෂය තුලදී ගෙවීම් කර අවසන් කරන ලද අතර ඉතිරි 10% කට ආසන්න ප්‍රතිපාදන ප්‍රමාණයට අදාල ගෙවීම් 2024 වර්ෂයේ සිදුකිරීමට සැලසුම් කර ඇත. | -එම- |
| (ඉ) | වැය විෂයය අංක 26-2507(13) යටතේ වැඩිහිටියන්ගේ දුම්කොළ භාවිතය පිළිබඳ ගෝලීය සමීක්ෂණය වෙනුවෙන් රු. 10,900,000 ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එයින් රු. 10,286,000 ක් උපයෝජනය කර රු. 613,400 ක් හෙවත් සියයට 6 ක් ඉතිරි වී තිබුණි. | වැය විෂයය අංක 26-2507(13) යටතේ මෙම සමීක්ෂණය සඳහා වෙන්කර තිබූ රු.10,900,000 ක ප්‍රතිපාදනයෙන් හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය හිමි වූ සීමාව දක්වා නිලධාරීන්ගේ ගෙවීම් කටයුතු සිදුකර අවසන් අතර ඉතිරි මුදල් ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) වෙත හරවා යැවීමට කටයුතු කර ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වැය විෂයය අංක 28-2507(13) යටතේ ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ ගෘහ ඒකක සමීක්ෂණය සඳහා රු. 25,000,000 ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එය සම්පූර්ණයෙන්ම උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | වැය විෂයය අංක 28-2507(13) යටතේ මෙම සමීක්ෂණය සඳහා අරමුදල් සම්පාදනය කරන ලද ආයතන විසින්ම අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කිරීම නිසා රු. 25,000,000 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |
| (උ) | වැය විෂයය අංක 29-2509(13) යටතේ වාර්ෂික වැඩ සැලැස්ම UNFPA සඳහා රු. 40,192,857 ක් වූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එයින් රු. 38,192,857 ක් උපයෝජනය කර<br>රු. 2,000,000 ක් හෙවත් සියයට 5 ක් ඉතිරි වී තිබුණි. | රු. 2,000,000 ක් වූ අරමුදල් තාක්ෂණික සහයෝගය වෙනුවෙන් ලබාදුන් අතර ඒ වෙනුවෙන් පවත්වන ලද වැඩ මුළුව සඳහා වියදම් ඍජුවම UNFPA ආයතනය මගින් දරණ ලද බැවින් වෙන් කරන ලද අරමුදල භාවිතා නොකරන ලදි. මෙම අරමුදල් එම ආයතනය වෙත පැවරීමට කටයුතු කරන ලදි. | -එම- |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිය ගිය නිලධාරීන් තුන් දෙනෙකුට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු.505,339 ක් වූ අතර එම ශේෂය තුළ වර්ෂ 03 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු. 92,750 ක් වූ ණය ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය. | කේ. විග්නේශ්වරන් මිය වෙතින් අයකරගත යුතු රු 92,750 ක මුදල නිලධාරිනියගේ මරණ පාරිතෝෂිතයෙන් අය කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය වෙත ඇතුලත් කර ඇත.<br><br>ඒ.පී. සින්ගන්කුට්ටිආරච්චි මෙයගේ විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාලව සියලු තොරතුරු 2022-09-09 දින Online Upload කර ඇත. විශ්‍රාම වැටුප සකස් වූ පසු අදාල මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.<br><br>ඩබ්.ඒ.එස්. ආර්. ජයලාල් මයාගේ රු: 176,429 ක් වන ආපදා ණය මුදල මරණ පාරිතෝෂිතයෙන් අඩු කිරීමට කටයුතු කර ඇත. අදාල ලේඛන 2024-04-26 දිනැති ලිපිය මගින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. | ණය ශේෂ නිරවුල් කරගැනීමට කඩිනමින් පියවර ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2005 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල සේවය හැර ගොස් ඇති නිලධාරීන් හත් දෙනෙකුට අදාළව එකතුව රු. 450,014 ක් වූ ණය ශේෂ හිඟහිට පවතින අතර එම ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඩබ්.එම්.ජේ.සී. වීරකෝන් (27,080) - මෙම නිලධාරියාගේ පදිංචිය පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි අතර විදේශගත වී ඇත්ද යන්න සොයා බැලීමට යොමු කරන ලද ලිපියට අදාලව 2024-05-15 වන දින සිහි කැඳවීමේ ලිපියක්ද ආගමන විගමන දෙපාර්තහෙමින්තුව වෙත යොමු කර ඇත.<br><br>ඩබ්.ඒ.ජේ.එස්. කුමාර (47,150) - මෙම නිලධාරියාගෙන් අයවිය යුතු මුදල 2024-05-31 වන දිනට පෙර ගෙවා නිම කරන ලෙස දැනුම් දෙමින් 2024-04-17 දිනැතිව ලිපියක් යොමු කර ඇත.<br><br>ඒ.ජී.එම්.එස්. කුමාර (38,410) -මෙම නිලධාරියාගේ පදිංචිය පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි අතර ජාතික හැඳුනුම්පත් අංකයට අදාලව රියදුරු බලපත්‍රයක් නිකුත් කර ඇත්ද යන්න සොයා බැලීම සඳහා යොමු කරන ලද ලිපියට අදාලව, 2024-05-15 දිනැතිව නැවත සිහි කැඳවීමේ ලිපියක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.<br><br>එම්.ජේ.ඩී.කේ. ප්‍රියකැළුම් (104,250) - ණය මුදල නොපමාව ගෙවන ලෙස නිලධාරියාගේ පුද්ගලික ලිපිනයට 2023-06-09 දිනැති ලිපියක් යවා ඇති අතර ඉන් පසු සිහි කැඳවීමේ ලිපියක්ද නිකුත්කර ඇත. ණය ලබා ගන්නා අවස්ථාවේ දී සේවය කරන ලද සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ද අදාළ ණය ගොනුව නොමැති බවට දන්වා ඇති බැවින් මේ පිළිබඳව ඉදිරි කටයුතු කළ යුතු ආකාරය විමසා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කිරීමට කටයුතු කර ඇත.<br><br>කේ.එම්.ඩී.ආර්.පී. පෙරේරා (78,200) - මෙම නිලධාරිනියගේ පදිංචිය පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි අතර විදේශගත වී ඇත්ද යන්න සොයා | -එම- |

බැලීමට යොමු කරන ලද ලිපියට අදාලව 2024-02-22 වන දින සිහි කැඳවීමේ ලිපියක්ද ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

එම්.බී.ආර්.ජේ. බණ්ඩාර (95,140) - මෙම නිලධාරියාගෙන් අයවිය යුතු මුදල සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින අතර 2024-08-01 දින නඩුව නැවත කැඳවීමට නියමිතව ඇත.

එම්.එස්.එම්. සෆ්රාස් (59,784) -නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර වර්තමාන තත්වය 2023-10-03 හා 2024-01-31 දිනැතිව ලිපි මගින් විමසා ඇත.

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(1), 104 (3) හා 104 (4) | - | මුද්‍රණ අංශයේ, 80 GSM මුද්‍රණ කඩදාසි තොගයේ රීම් 242ක ඌනතාවයක් පිළිබඳව මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අස්ථානගතව ඇති මුද්‍රණ කඩදාසි තොගය අනාවරණය කර ගැනීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර මෙම කාර්ය සඳහා කාලයක් ගතවීම හේතු කොට ගෙන මු.රෙ 104(3) යටතේ ප්‍රාරම්භක වාර්තාව ද ප්‍රමාද විය . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 756(6) | - | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්තතා වාර්තා කිරීම හා | මේ සඳහා මු. රෙ 104 යටතේ පත්කරන ලද කමිටුවේ කමිටු වාර්තා ලද පසු මෙම ඌනතා පිළිබඳව කටයුතු අවසන් කිරීමටත්, අනෙකුත් | -එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි මුදල් වර්ෂයේ අප්‍රේල් 15 ට පෙර කළ යුතු වුවත් 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, ප්‍රධාන කාර්යාලයේ අයිතම් වල ඌනතා 182 ක් හා දිස්ත්‍රික් කාර්යාල වලට අයත් අයිතම් වල ඌනතා 66 ක් ලෙස මුළු ඌනතා 248 ක් පැවතුණ ද මේ පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඌනතාවයන් වාර්තා වූ අංශවල නැවත භාණ්ඩ සමීක්ෂණය සිදුකරන ලෙසටත් උපදෙස් ලබා දී ඇති අතර ඒ අනුව අදාල වාර්තා ලද පසු මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කෙරෙනු ඇත. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 880 | - | ඇප තැබිය යුතු එහෙත් ඇප තැබීමට කටයුතු කර නොමැති නිලධාරීන් 66 ක් සිටින බව නිරීක්ෂණය විය. | මෙතෙක් ඇප තැන්පත් කර නොමැති නිලධාරීන්ගෙන්ද ඇප අයදුම්පත්‍ර ලබාගෙන ඇප තැන්පතු ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | -එම - |

## 2.4 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුමේ ශේෂය රු. 7,906,833 ක් වූ අතර එම ශේෂය තුළ ඇතුළත් තැන්පතු 2 කට අදාළ එකතුව රු. 5,633,148 ක ශේෂ වර්ෂ 2 සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවතියද එම ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ළමා නිවාසගත ළමුන් පිලිබඳ සමීක්ෂණය - මේ සඳහා ගෙවීම් කිරීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය හිමිව නොතිබූ බැවින් අදාල ගෙවීම් සිදු නොකල නිසා පොදු තැන්පත් ගිණුමෙහි ශේෂයක්ව පැවතිණි. නමුත් මේ වන විට ඒ සඳහා අනුමැතිය ලැබී ඇති බැවින් එහි ගෙවීම් ඉදිරියේදී සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.<br><br>ගෝලීය වැඩිහිටි දුම්කොළ සහ මධ්‍යසාර සමීක්ෂණය. - 2021 වර්ෂයේ පවත්වන ලද GATS සමීක්ෂණයට අදාල පළමු වටයේ ක්ෂේත්‍ර රාජකාරී ඉටුකල නිලධාරීන්ගේ ක්ෂේත්‍ර කාර්යාලය පවත්වාගැනීම සඳහා දැරූ වියදම් පියවා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීමට වෙන් කර ඇති ශේෂයක් වේ. එම මුදල් ගෙවීම් මෙම වසර තුල සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෑම වසර 03 කට වරක්ම සිදු කළ යුතු ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය (HIES), අවසන් වරට 2019 වසරේ දී සිදු කර තිබූ අතර 2022 වර්ෂයේ දී සිදුකළ යුතුව තිබුණි. මෙම සමීක්ෂණයෙන් අනාවරණය කරගනු ලබන තොරතුරු රටේ සමාජ, ආර්ථික හා | මෙම සමීක්ෂණය 2025 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා පැවැත්වීමට අවශ්‍ය කටයුතු මෙ වන විට සැලසුම් කරමින් පවතී. | ඉතා වැදගත් සමාජ ආර්ථික දර්ශක ගණනාවක් සකස් කරනු ලබන මෙම සමීක්ෂණය කඩිනමින් සිදුකිරීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන ප්‍රතිපත්ති හා සැලසුම් ඇගයීමට සහ හඳුන්වාදීමටත්, වෙනත් විවිධ සමාජ ආර්ථික දර්ශක, දරිද්‍රතා දර්ශක ගණනය කිරීම සඳහාත් යොදා ගැනේ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) හා ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) ගණනය කිරීමේදී භාවිතා කරනු ලබන භාණ්ඩ පැසෙහි බරතැබීම් යොමු කාලය (Reference Period) මෙම සමීක්ෂණය මඟින් ආවරණය කරනු ලබන අතර කුටුම්බයන්හි මුළු පාරිභෝජන වියදමට එක් එක් අයිතමයේ දායකත්වය සලකා බර තැබීම් සිදුකිරීමට ද මෙම සමීක්ෂණයේ දත්ත ඉතා වැදගත් වේ. මෙම සමීක්ෂණය සිදු කිරීමේ ප්‍රමාදය හේතුවෙන් එම සමීක්ෂණයේ තොරතුරු පදනම්කරගෙන පිළියෙල කරනු ලබන CCPI සහ NCPI දර්ශක තුලින් ගණනය කරනු ලබන උද්ධමන අනුපාතය මඟින් මෑත කාලයේ දී සිදු වූ ආර්ථික තත්ත්වයහි වෙනස් වීම් වල බලපෑම නිවැරදිව පිළිබිඹු නොවිය හැකි බවට නිරීක්ෂණය විය. | | |
| (ආ) | ජන හා නිවාස සංගණනය 2021 - මෙම සංගණනය වෙනුවෙන් පිළියෙල කළ මූලික සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොවූ අතර 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, එම වර්ෂයේ දී අවසන් කිරීමට සැලසුම් කර තිබුණ | 2024 ඔක්තොම්බර් මාසයට පෙර ගණන් ගැනීමේ අදියර අවසන් කිරීමට සියළු කටයුතු සූදානම් කර ඇත. | සැලසුම් කළ ආකාරයට කාල ප්‍රමාදයකින් තොරව සංගණන කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ද මේ දක්වා ලැයිස්තුගත කිරීමේ අදියර පමණක් අවසන් කර තිබුණි. සංගණනයේ කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2024 අප්‍රේල් 30 දින දක්වා රු. 1,233,151,415 දරා ඇති බව නිරීක්ෂණය විය. මීට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලයේ වැය විෂයයන් මඟින් 2022 හා 2023 වර්ෂ වල මෙම කාර්යය වෙනුවෙන් එකතුව රු. 4,813,352 ක් වූ වියදම් දරා තිබුණි. | | |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සැසඳීමේදී ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි දෙපාර්තමේන්තුවේ අංශ 07 ක් විසින් ඉටු කළ යුතු කාර්යභාරයන් 11 ක් ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ජන හා නිවාස සංගණනය 2024 ට අදාල කටයුතු හේතුවෙන් සැලසුම් කල ප්‍රමාණයට කාර්ය සාධනයක් ලබාගත නොහැකි විය. | සැලසුම් කළ පරිදි කාර්යභාරයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ අංශ 10 ක් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත නිමවුම් මට්ටම් ළගා කර ගෙන නොතිබුණු අතර කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 5 ක සිට සියයට 75 ක් දක්වා පරාසයක පැවැතුණි. | ජන හා නිවාස සංගණනය 2024 ට අදාල කටයුතු හේතුවෙන් සැලසුම් කල ප්‍රමාණයට කාර්ය සාධනයක් ලබාගත නොහැකි විය. | සැලසුම් කළ පරිදි අපේක්ෂිත නිමැවුම් මට්ටම් ළඟා කරගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු. මිලියන 1,116 කට අධික වියදමක් දරා ඉදි කර ඇති මහල් 12 කින් යුත් ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල නියමිත ප්‍රමිතියට අනුකූලව ඉදිකර නොමැති බවටත්, නියමිත පරිදි නඩත්තු කර නොමැති බවටත් නිරීක්ෂණය වන අතර ගොඩනැගිල්ලේ ඉහළ සිට සහ පහල මහල් දක්වා ජලය කාන්දු වන බවත්, 6 වන මහලේ විවෘත ප්‍රදේශයේ වීදුරු ආවරණය තුලින් ගොඩනැගිල්ල තුලට ගලා එන ජලය විදුලි සෝපාන ලිං තුළට ඇතුළු වන බවත්, බිම යොදා ඇති අනාරක්ෂිත විදුලි රැහැන් වල පරිවාරක නල දිගේ කාර්යාල පරිශ්‍ර තුලට ජලය | කාර්යාලීය ගොඩනැගිල්ලේ ඉහළ මතුපිට සහ පැති බිත්ති ජල මුද්‍රා කිරීම නිසි පරිදි සිදුවී නොමැති බැවින් වැසි ජලය කාන්දුවීමක් සිදුවේ.<br><br>06 වන මහලේ විවෘත ප්‍රදේශයේ සිට විදුලි සෝපානයේ ඉදිරිපස ප්‍රදේශය වෙත වැසි ජලය කාන්දු වේ.<br><br>කාර්යාල පරිශ්‍රයන්ට වැසි ජලය කාන්දු වන ස්ථානවල ඇති ඇතැම් විදුලි පරිපථ විසන්ධි කර ඇත. ඇතැම් විදුලි පරිපථ ජලය හා නොගැටෙන සේ ස්ථානයන් වෙනස්කොට සවි කර ඇත. විදුලි රැහැන් සම්බන්ධ As Built Drawings නොමැති බැවින් ඉදිරි පියවර ගැනීම අපහසුවී ඇත. | හැකි ඉක්මනින් උචිත අලුත්වැඩියාවන් සිදු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ගලා එන බවත් නිරීක්ෂණය වන අතර ගොඩනැගිල්ල සඳහා කොන්ත්‍රාත් කරුගෙන් ලබාගත යුතු සහතික වීම් ලබාගැනීමට කළමනාකාරීත්වය විසින් කටයුතු නොකිරීම හේතුවෙන් කඩා වැටී ඇති ඉදිරිපස දොර අලුත්වැඩියාකිරීම සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ගෙවා ඇති රු. මිලියන 3.3 ක් වූ මුදල රජයට අමතර වැය බරක් වී ඇති බවත් අනාවරණය විය. | | |
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 07 ඇල්බට් චන්ද්‍රවංකයෙහි ඇති රුට් 03 පර්චස් 1.45ක් වූ මුද්‍රණ අංශය පිහිටි පරිශ්‍රය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | අදාළ පරිශ්‍රය විධිමත් පරිදි නඩත්තු කර පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබූ අතර පිවිසුම් ගේට්ටුව කැඩී දිරාපත් වී ගබඩාවල ජනෙල් පියන්, දොරවල් සහ වහල කැඩී අබලන් තත්ත්වයේ පවතින බවත් භූමිය පුරා තැනින් තැන අබලි ද්‍රව්‍ය ගොඩ ගසා ඉතා අපිරිසිදු තත්ත්වයේ පවතින බවත්, දිරාපත් වූ ගොඩනැගිලිවල කොටස් ගැලවී වැටෙන බවත් නිරීක්ෂණය විය. | අලුත්වැඩියාවට අදාළ ඇස්තමේන්තු සඳහා ප්‍රසම්පාදන අනුමැතිය ලද පසු ප්‍රධාන ගේට්ටුව අලුත්වැඩියාව, ගරාජයේ අලුත්වැඩියාව හා තනි මහලේ ගොඩනැගිල්ලක වහලයේ අලුත්වැඩියාව කඩිනමින් සිදු කෙරේ.<br><br>ගබඩාවන් ලෙස භාවිතා කරනු ලබන ගොඩනැගිලිවල දොර, ජනෙල් හා උළුවහු දිරාපත්වී ඇති බැවින් එම ස්ථාන ගඩොල් යොදා ආවරණය කිරීමට යෝජනා වී ඇති අතර මුද්‍රණ අංශ ප්‍රධානීගේ එකඟතාවය ලද පසු ඉදිරි කටයුතු කඩිනමින් සිදු කෙරේ. | රජයේ දේපලවලට නිසි ආරක්ෂාවක් ලැබෙන ලෙස විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීමටත් ඒවා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කිරීමටත් කළමනාකාරිත්වයේ ප්‍රමාණවත් අවධානයක් යොමුවිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | පවතින අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමට කොළඹ මහ නගර සභාව වෙත ලිපියකින් දන්වා සිටින ලදී.<br><br>මුද්‍රණ යන්ත්‍ර ස්ථාපිත කොට ඇති ගොඩනැගිල්ල තුලට ජලය පැමිණීම වැලැක්වීම සඳහා ප්‍රවේශය හා පිටවීම ආවරණය වන පරිදි වැලි කොට්ට යොදා ආවරණය කිරීමද සිදු කරන ලදී. | |
| (ii) | මෙම පරිශ්‍රය තුළ පවත්වාගෙන ගිය කාර්යාල කටයුතු බත්තරමුල්ල ප්‍රධාන ගොඩනැගිල්ලට රැගෙන යාමේ දී පැවති වායු සමීකරණ යන්ත්‍ර 52 ක් විධිමත් පරිදි ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ අතර වායු සමීකරණ යන්ත්‍ර 12 ක් පමණක් භාවිතාවෙමින් පවතින බවට අනාවරණය විය. | මුද්‍රණ අංශ පරිශ්‍රය තුළ පවතින භාවිතයට නොගන්නා ලද වායු සමීකරණ යන්ත්‍ර වලින් කොටසක් මේ වන විටත් වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාකරු ලවා පරීක්ෂා කර බලන ලද අතර එයින් ඇතැම් යන්ත්‍ර ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ පැවතිණි. දීර්ඝ කාලයක් මෙම යන්ත්‍ර භාවිතා කර නොමැති වීම හේතුවෙන් භාවිතයට ගැනීමට පෙර තත්ව වාර්තාවක් ලබාගැනීමට කටයුතු කරමි. | -එම- |
| (iii) | මුද්‍රණ අංශයේ සවිකර තිබූ වායු සමීකරණ යන්ත්‍ර 03 ක බාහිර සිසිලන ඒකක (outdoor units) 03 ක් අස්ථාන ගත වී තිබුණ ද මු. රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇත. | -එම- |
| (iv) | මුද්‍රණ අංශයේ එක් එක් යන්ත්‍රය මගින් සිදුකරනු ලබන කාර්යයන් වෙනුවෙන් නිකුත් කෙරෙන ද්‍රව්‍ය ප්‍රමාණයන් සහ එම යන්ත්‍රයේ නිමැවුම සටහන් ඇතුළත්ව විධිමත් ලේඛනයක් නඩත්තු නොකරන බැවින් යන්ත්‍ර සේවා කිරීමේ අවශ්‍යතාවය සහ ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය කල්තියා | මුද්‍රණ යන්ත්‍ර දෙකෙහි නිමවුම් පාඨාංක දැක්වෙන මීටර අළුත්වැඩියා කිරීමෙන් පසු නියමිත පරිදි අදාල ලේඛන පවත්වාගෙන යාමට ඉදිරියේදි කටයුතු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | ප්‍රමාණවත් පාලන පද්ධතීන් හඳුන්වා දිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | හඳුනා ගැනීමට නොහැකි වී තිබූ අතර අක්‍රමිකතා සිදුවීමට ඉඩකඩ පවතින බව නිරීක්ෂණය වේ. | | |
| (v) | මුද්‍රණ කටයුතු සඳහා යොදා ගන්නා කඩදාසි, තීන්ත වැනි අමු ද්‍රව්‍ය නිසි පරිදි ගබඩාකර නොතිබූ අතර ඒ සඳහා Bin card ඇතුළුව විධිමත් ලේඛන නඩත්තු කර නොතිබුණි. | ගබඩාකර ඇති එක් එක් ද්‍රව්‍යයන් සඳහා බින් පත්‍ර (Bin Card) නඩත්තුවක් මෙතෙක් සිදුකර නොමැති අතර අදාල බින්පත්‍ර ගබඩා භාරකරු විසින් නඩත්තු කල යුතුය. 2024 ජූනි 01 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කෙරෙමින් පවතී. | -එම- |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 25 ක් හෙවත් පුරප්පාඩු 455 ක් පැවතුණි. | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් 25% ක් හෙවත් පුරප්පාඩු 455 ක් පැවතුණි. රාජ්‍ය අයවැය චක්‍රලේඛ 03/2022 මගින් සේවක බඳවාගැනීම් සීමා කිරීම හේතුවෙන් 2023 වර්ෂයේ බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වූ අතර පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා මෙම වර්ෂය තුළදී කටයුතු කරමින් පවතී. | අදාළ විධිවිධාන පරිදි කටයුතු කර විධිමත් පරිදි පුරප්පාඩු පිරවීමට හෝ උචිත පරිදි කාර්ය මණ්ඩලය සංශෝධනයට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති හා 02/2018 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් 2023/2024 වර්ෂ සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මේ කෙටුම්පතක් පිළියෙල කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |